රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 233

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1983 දෙසැම්බර් මස 28 දින.

සියලුම ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන් වෙත ය.

අධිකර තනතුරුවල වැඩ බැලීමට පත්කරන රජයේ
නිලධාරීන් ගේ සහ නැවත සේවයේ යොදවන
විශ්‍රාමිකයන් ගේ වැටුප් සහ පාරිශ්‍රමිකයන්

කරුණාකර පහත සඳහන් කරුණු සටහන් කර ගන්න.

I. රජයේ සේවයෙන් විශ්‍රාම ගිය තැනැත්තෙකු රජයේ සේවයේ තනතුරක නැවත සේවයේ යෙදවීමට හෝ රාජ්‍ය සංස්ථාක සේවයේ යෙදවීමට හෝ අමාත්‍ය මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබාගත යුතු ය.

II. වයස අවුරුදු 60 සම්පූර්ණ කිරීමට පෙර රජයේ සේවයෙන් විශ්‍රාම ගොස් ඇති තැනැත්තෙකු රජයේ සේවයේ තනතුරක නැවත සේවයේ යෙදවීමට, හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යෙදවීමට හෝ යම් විශේෂ හේතු ඇති බවට අමාත්‍ය මණ්ඩලය සෑහීමට පත් වුවහොත් මිස ඔහු නැවත සේවයේ යොදනු නොලැබේ.

III. නිශ්චිත විධිවිධානයන් යටතේ රජයේ නිලධාරියෙකුට අධිකර තනතුරක පූර්ණ රාජකාරි ඉටුකිරීමට සිදුවන අවස්ථාවන හැර, රජයේ සේවයේ හෝ රජයේ සේවයේ සහ රාජ්‍ය සංස්ථාවක හෝ එක් තනතුරකට වැඩි තනතුරු දරන යම් තැනැත්තෙකු සියලු ම රාජකාරි කිරීම අවශ්‍ය වන්නේ නම් අමාත්‍ය - මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු ය.

IV. පත්කිරීමේ බලධරයා අමාත්‍ය මණ්ඩලය වන අවස්ථාවන්හි දී හැර, තනතුරක් හිමි වශයෙන් දරන තැනැත්තා නැති අතර හෝ තාවකාලික [illegible] සිරවීමට හෝ යම් රාජකාරිවලට අතිරේකව තනතුරක වැඩ බැලීමට රජයේ නිලධාරියෙකු පත්කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම අවශ්‍ය නොවේ. එවැනි අවස්ථාවන්හි දී පාරිශ්‍රමිකයන් සඳහා රීති ආයතන සංග්‍රහයේ සඳහන් ඇත.

V. වයස අවුරුදු 60 සම්පූර්ණ කිරීමෙන් පසු රජයේ සේවයෙන් විශ්‍රාම ගොස් ඇති තැනැත්තෙකු රජයේ සේවයේ තනතුරක නැවත සේවයේ යෙදවුවහොත් හෝ රාජ්‍ය සංස්ථාවක සේවයේ යෙදවුවහොත් හෝ, ඔහුට එහි දෙනින්, ඔහුගේ විශ්‍රාම වැටුපත් (දීමනා රහිතව) ගෙවන් අතර ඔහු නැවත සේවයේ යොදා ඇති/සේවයේ යොදා ඇති, තනතුරේ දීමනා සහිතව වැටුප හෝ අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති පිරිවැයක් වැටුප හෝ යන දෙකින් සීමා වියදම් වීමනාව ගෙවිය යුතු ය. නැවත සේවයේ යොදවන්නන් ඔහු විශ්‍රාම ගන්නාවිට දැරූ තනතුරෙහි ට නම් විශ්‍රාම ගන්නා අවස්ථාවේ දී ලබමින් සිටි වැටුප සීමාව ගෙවිය යුතු ය.

/...2

VI. වයස අවුරුදු 60 සම්පූර්ණ කිරීමට පෙර විශ්‍රාම ගෙන ඇති පුද්ගලයෙකු නැවත සේවයේ යෙදවීමට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති අවස්ථාවක දී ඔහුට ඉහත (V) දක්වා ඇති ආකාරයට ගෙවිය යුතු ය.

VII. තම නියම තනතුරේ පූර්ණ රාජකාරියට අමතරව, නිතිවය විධිවිධානයන් යටතේ අමතර තනතුරක පූර්ණ රාජකාරි ඉටුකරන රජයේ නිලධරයෙකුට ද, ඉහත (III) යටතේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති නිලධරයෙකුට ද, තම නියම තනතුරේ දීමනා සහිත වැටුප ද, තම නියම තනතුරේ රාජකාරි වලට අමතරව පූර්ණ රාජකාරි ඉටුකරන තනතුරේ දීමනා රහිත වැටුප ද ගෙවිය යුතු ය. එසේ වුවද, අමතර තනතුරේ පූර්ණ රාජකාරි ඉටුකිරීම සඳහා ගෙවන ගෙවීම, එම අතිරේක තනතුරේ ආරම්භක වැටුපෙන් 1/4 කට සීමාවිය යුතු ය. වැටුපක් නියම කර නැති තනතුරක් සම්බන්ධයෙන් නම්, 1/4 ගණන් බැලිය යුත්තේ, භාණ්ඩාගාරයේ ලේකම් ගේ උපදෙස් ද ඇතිව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්, ඉල්ලීමක් කළවිට, තීරණය කරන කල්පිත වැටුපෙන් ය.

02. 1982.05.31 දින හා අංක. 197 (VII) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙන් සංශෝධනය කර ඇති ආයතන සංග්‍රහයේ VII වෙනි පරිච්ඡේදයේ 12:6 වගන්තියේ දැක්වෙන වැඩබැලීමේ වැටුප් පිළිබඳ සීමා ක්‍රියාත්මක නොවේ.

03. මෙම චක්‍රලේඛයේ ප්‍රතිපාදනවලින් උද්ගත වන පාරිශ්‍රමික වෙනස්වීම් ක්‍රියාත්මක වන්නේ 1984 ජනවාරි 1 වැනි දින සිට පමණි.

Siriwardhana

ලේකම්,

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.